සැ. යු.- 2010.10.29 දින පළ වූ අංක 1,678 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,679 - 2010 නොවැම්බර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2010.11.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණයේ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 716 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරවනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 නොවැම්බර් මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ඔක්තෝබර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


715- B 080168 —2,200 (2010/11)
D1–

# විවිධ දැන්වීම්

## හඳගල වළගම්බා පුරාණ ගල්ලෙන් රජමහ විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

නීතිඥ ශ්‍රියානි විජේවික්‍රම වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "හඳගල වළගම්බා පුරාණ ගල්ලෙන් රජමහ විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි", යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංවර්ධන සභාව සංස්ථාගත කිරීමයි :-

1. ප්‍රදේශයේ දිළිඳු හා අසරණ අය සඳහා නිවාස, සෞඛ්‍ය පහසුකම්, පිරිසිදු පානීය ජල අවශ්‍යතාවන් සපුරාලීම ;
2. අදාළ දිස්ත්‍රික්කයේ, අධ්‍යාපනය ලබන දුප්පත් දරුවන්ගේ අධ්‍යාපනය නගාසිටුවීමට පහසුකම් සැපයීම ;
3. සාමාජිකයන්ගේ ආගමික, සංස්කෘතික, සාමාජික හා සෞඛ්‍යමය සුභසාධන සේවා පවත්වාගෙන යාම, ඒවාට ධෛර්ය දීම සහ ආධාර කිරීම.

යනාදිය වේ.

නීතිඥ ශ්‍රියාණි විජේවික්‍රම,
පාර්ලිමේන්තු මන්ත්‍රිනි,
දිඟාමඩුල්ල දිස්ත්‍රික්කය.

අංක 02,
පණ්ඩුකාභය මාවත,
අම්පාර.

11-33

## මෛත්‍රීපාල සේනානායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

නීතිඥ ශ්‍රියානි විජේවික්‍රම වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "මෛත්‍රීපාල සේනානායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි", යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි ;

1. දිළිඳුකම අවම කිරීම හා දිළිඳු පවුල් සවිබල ගැන්වීම සඳහා වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම, ස්වයං රැකියා උත්පාදනය සඳහා ඔවුන්ට රැකියා ව්‍යාපෘති හඳුන්වා දීම, අඩු ආදායම්ලාභී පවුල්වල රෝගීන්ට පිහිටවීම හා එම පවුල්වල මංගල්‍ය හා අවමංගල්‍ය කටයුතුවල දී පිළිසරණ වීම.
2. ශ්‍රී ලාංකීය ජාතික හා සංස්කෘතික උරුම හිමිකම් පිළිබඳව දැනුම හා අවබෝධය හුවමාරුකර ගැනීමේ වැඩ සටහන් සංවිධානය කිරීම, එකී උරුමයන් ආරක්ෂා කර ගැනීම හා ඒ සම්බන්ධව සංවිධානය කෙරෙන වැඩ සටහන් සාර්ථකව දියත් කිරීම පිණිස රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල ආධාර උපකාර ලබා ගැනීම

යනාදිය වේ.

නීතිඥ ශ්‍රියාණි විජේවික්‍රම,
පාර්ලිමේන්තු මන්ත්‍රිනි,
දිඟාමඩුල්ල දිස්ත්‍රික්කය.

අංක 02,
පණ්ඩුකාභය මාවත,
අම්පාර.

11-34

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.